# කාර්ය පත්‍රිකාව

**1.සතිය :-** 13 **විෂය :-** භූගෝල විද්‍යාව **අදාළ සතිය :-** ඔක්තෝම්බර්3-9

**2. පාඩම හෝ ඒකකය :-** ශ්‍රී ලංකාවේ පිහිටීම

**3. මෙම සතිය තුළ නියමිත පාඩම්වලින් ලබාගත යුතු ඉගෙනුම් ඵල :-**

- පෘථිවි ආදර්ශ ගෝලය ඇසුරින් පිහිටීම හඳුනා ගනියි.
- ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ පිහිටි දූපතක් නිරීක්ෂණය කිරීම.
- ලෝක ආකෘති සිතියමක් ඇසුරින් ශ්‍රී ලංකාවේ පිහිටීම ප්‍රදර්ශනය කරයි.
- ශ්‍රී ලංකාවේ පිහිටීම පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම.

**4. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් :-**

- පෘථිවි ආදර්ශ ගෝලය හා ජාතික සිතියම් සංග්‍රහය ඇසුරින් ශ්‍රී ලංකාවේ පිහිටීම නිවැරදිව හඳුනා ගන්න.
- ශ්‍රී ලංකාව අයත්වන මහාද්වීපය, සාගරය ආදි තොරතුරු නිරීක්ෂණය කරන්න
- ලෝක ආකෘති සිතියමක් (A4 ප්‍රමාණයේ කඩදාසියක අඳින්න හෝ මුද්‍රිත සිතියමක් ලබා ගන්න) එහි නිවැරදිව ශ්‍රී ලංකාවේ පිහිටීම තද දුඹුරු පාටින් සේයා කර නම් කරන්න.
- එම සිතියම තුළ නිවැරදිව ආසියා මහද්වීපය ලා දුඹුරු පාටින් වර්ණ ගන්වා, ඉන්දියන් සාගරය ද නිල් පැහැයෙන් සේයා කරන්න.
- ශ්‍රී ලංකාව අවට ඇති සෙසු මුහුදු ප්‍රදේශ, සමුද්‍ර සන්ධිය ආදිය නම් කරන්න.
- ඔබගේ නිර්මාණයට සුදුසු මාතෘකාවක් යොදන්න.

**5. ඇගයීම/ තක්සේරුකරණය ක්‍රමවේදය :-**

01) හිස්තැන් පුරවන්න.

i. ශ්‍රී ලංකාව----------------- සාගරයේ පිහිටි දූපතකී.
ii. ශ්‍රී ලංකාව----------------- මහද්වීපයට අයත් රටකී.
iii. ලොව විශාලතම මහද්වීපය-------------- යි.
iv. ඉන්දියාවත් ශ්‍රී ලංකාවත් අතර පිහිටි පටු මුහුදු තීරය ----------------- නම් වේ.
v. ශ්‍රී ලංකාව ඉන්දියාවට ------------------ දෙසින් පිහිටා ඇත. (ලකුණු 1×5=05)

02) පහත සඳහන් තොරතුරු ලෝක ආකෘති සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

i. අරාබි මුහුද
ii. ඉන්දියාව
iii. ඉන්දියන් සාගරය
iv. පොක් සමුද්‍ර සන්ධිය
v. බෙංගාල බොක්ක

(ලකුණු 1×5=05)

**6. ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කරගත හැකි පොත් හා වෙනත් ආධාරක :-**

- පෘථිවි ආදර්ශ ගෝලය
- ජාතික සිතියම් සංග්‍රහය

නිලධාරියාගේ නම------------------------------- පාසල/පිරිවෙන -----------------------------------